# කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රාජගිරිය DPJ ගොඩනැගිල්ලෙහි ඇති භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන කාමර වෙන් කිරීම් (partition)කොටස්ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා මිල ගණන් කැඳවීම

කොන්ත්‍රාත් අංකය :- **MOA/ Shopping/ O1/ 2021**

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

ගොවිජන මන්දිරය, 80/ 5, රජමල්වත්ත පටුමග,

බත්තරමුල්ල

**www.agrimin.gov.lk**

# I වන කොටස

# ලංසුකරුවන් සඳහා උපදෙස් (අයි.ටී.බී)

## අ: පොදු කරුණු

| | | | |
|---|---|---|---|
| **(අ) සාමාන්‍ය** | | | |
| 1 | මිල යෝජනාවේ විෂය පථය | 1.1 | රාජගිරිය DPJ ගොඩනැගිල්ලේ භාවිතයෙන් ඉවත් කරනු ලබන කාමර වෙන්කිරීම් (Partition) කොටස් ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා දත්ත පත්‍රිකාවේ නම් කර ඇති කැඳවුම්කරු විසින් මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. |
| **(ආ) අන්තර්ගත ලේඛන** | | | |
| 2. | | 2.1 | පහත දැක්වෙන දෑ ලේඛනවලට අයත් වේ. |
| | අන්තර්ගත ලේඛන | | I වන කොටස:ලංසුකරුවන්ට උපදෙස්<br>IIවන කොටස: දත්ත පත්‍රිකාව<br>III වන කොටස: ප්‍රමාණ පත්‍රය<br>IV වන කොටස: මිල සාරාංශය ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය.<br>V වන කොටස: කොන්දේසි සහ උපදෙස් |
| **(ඇ) මිල යෝජනා සැකසීම** | | | |
| 3. | මිල යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘතිය හා මිල යෝජනා ලේඛනය | 3.1 | III වන කොටසේ දැක්වෙන ප්‍රමාණ පත්‍රය සහ IV වන කොටසේ මිල සාරාංශ පත්‍රිකාව යොදා ගෙන ලංසුකරුවන් විසින් මිල යෝජනා ඉදිරිපත් කළ යුතුවේ. ආකෘති පත්‍රයේ ස්වරූපය විකෘති වන ආකාරයේ වෙනස් කම් නොකළ යුතුවේ. විකල්ප ආකෘති පිළිගනු නොලැබේ. ආකෘති පත්‍රයේ හිස්තැන් නොතිබෙන සේ ඉල්ලා ඇති විස්තරවලින් හිඩැස් පිරවිය යුතුවේ. |
| | | 3.2 | විකල්ප මිල යෝජනා සලකා බලනු නොලැබේ. එකම අයිතමයක් සඳහා විකල්ප මිල යෝජනා ඉදිරිපත් නොකරන ලෙස උපදෙස් දෙන අතර, ඔවුන් සතු ඉහලම තරගකාරී මිල ගණන් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනු ලැබේ. |
| 4. | මිල ගණන් හා වට්ටම් | 4.1 | දත්ත පත්‍රිකාවේ විශේෂකොට දක්වා නැති අවස්ථාවල හැරෙන්නට අනික් සියලුම මිල යෝජනා ලංසු ලේඛනවල ඒ ඒ අයිතමයට වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතු වේ. |
| 5. | මිල යෝජනාවේ වලංගු කාලය | 5.1 | ලංසු ඉදිරිපත් කිරීමට දී ඇති අවසන් දිනෙන් පසු දින හැටතුනක් (63) තෙක් මිල යෝජනා වලංගුව පැවතිය යුතු ය. එනම් **2021.04.29** දින දක්වා වලංගු විය යුතුය. |
| 6. | මිල යෝජනාව අත්සන් කිරීමේ ආකෘතිය | 6.1 | මිල යෝජනාව යතුරු ලේඛනය කිරීමෙන් හෝ නොමැකෙන තීන්තෙන් ලිවිය යුතු අතර, ලංසුකරු වෙනුවෙන් අත්සන් කිරීමට නියමිත පරිදි බලය ලබාදෙන ලද පුද්ගලයකු විසින් ලංසුකරු වෙනුවෙන් අත්සන් කළ යුතු අතර ආයතන මුද්‍රාව තබා තිබිය යුතුය. |
| **(ඈ) මිල යෝජනා ඉදිරිපත් කිරීම හා විවෘත කිරීම** | | | |
| 7. | මිල යෝජනා ඉදිරිපත් කිරීම | 7.1 | ලංසුකරු විසින් ඔවුන්ගේ මිල ලේඛන මුද්‍රා තැබූ කවර තුළ බහා විශේෂ කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය ලියා කැඳවුම්කරුගේ ලිපිනයට ගෙනැවිත් භාරදීම හෝ තැපැලෙන් එවීම කළ යුතුවේ. |
| | | 7.2 | උපදෙස් දී ඇති පරිදි මිල ලේඛනවල මුද්‍රා තබා නොතිබීමෙන් හා සලකුණු නොයෙදීමෙන් වන අස්ථානගතවීම හා බලාපොරොත්තු රහිත විවෘත කිරීම් සම්බන්ධයෙන් වගකියනු නො ලැබේ. |

| | | | |
|---|---|---|---|
| 8. | මිල යෝජනා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | 8.1 | II වන කොටසේ දත්ත පත්‍රිකාවේ පෙන්වා දී ඇති දිනට හා වෙලාවට පෙර මිල යෝජනා කැඳවුම්කරු වෙත ලැබිය යුතුවේ. |
| 9. | ප්‍රමාද වී ලැබෙන ලංසු | 9.1 | නියමිත දිනට හා වේලාවට පසුව, ප්‍රමාද වී ලැබෙන කවර හෝ ලංසුවක් ඉහත දැක්වූ 8.1 වගන්තිය ප්‍රකාර කැඳවුම්කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 10. | මිල යෝජනා විවෘත කිරීම | 10.1 | දත්ත පත්‍රිකාවේ නිශ්චිතව පෙන්වා දී ඇති ලිපිනයේ දී, දිනයේ දී හා සඳහන් වේලාවේ දී ප්‍රසිද්ධියේ කැඳවුම්කරු විසින් මිල යෝජනා විවෘත කරනු ඇත. |
| | | 10.2 | ලංසුකරුගේ නියෝජිතයෙකුට එම අවස්ථාවට පැමිණ තමන්ගේ පැමිණීම සටහන් කළ හැකිවේ. |
| **(ඉ)මිල යෝජනා ඇගැයීම හා සංසන්දනය කර බැලීම.** | | | |
| 11. | පැහැදිලි කිරීම් | 11.1 | මිල යෝජනා පරීක්ෂා කිරීමේ දී, ඇගයීමේදී හා සංසන්දනය කිරීමේ දී කැඳවුම්කරු තම අභිමතය පරිදි තමන්ගේ මිල යෝජනා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ලංසුකරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැකි වේ. ලංසුකරුවෙකු විසින් තම මිල යෝජනා පිළිබඳව කරන පැහැදිලි කිරීම් කැඳවුම්කරුගේ ඉල්ලීමට ප්‍රතිචාර නොදක්වන්නේ නම් එබඳු මිල යෝජනා සලකා බලනු නොලැබේ. |
| | | 11.2 | පැහැදිලි කිරීම පිළිබඳ කැඳවුම්කරුගේ ඉල්ලීම හා ඊට දක්වන ප්‍රතිචාරය ලිඛිතව විය යුතුවේ. |
| 12. | මිල යෝජනා ඇගයීම | 12.1 | සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇතැයි තීරණය කරනු ලැබ ඇති මිල යෝජනා කැඳවුම්කරු විසින් ඇගයීමට ලක් කෙරේ. |
| | | 12.2 | මිල යෝජනාවක් ඇගයීමේ දී කැඳවුම්කරු පහත දැක්වෙන කරුණු සලකා බලනු ඇත.<br>(අ) ඉදිරිපත් කර ඇති මිල ගණන්.<br>(ආ) අංක ගණිතමය දෝෂ නිවැරදි කිරීම සඳහා මිල ගැළපීම.<br>(ඇ) ලබාදෙන වට්ටම් සඳහා මිල ගැළපීම්. |
| 13. | කවර හෝ මිල යෝජනාවක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ සියලුම යෝජනා ප්‍රතික්ෂේප කිරීමට කැඳවුම්කරුගේ බලය | 13.1 | කිසියම් ලංසුවක් පිළිගැනීමට හෝ මිල ගණන් ඉදිරිපත් කළ අය සමඟ කිසිදු බැඳීමක් ඇතිකර ගැනීමට පෙර ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ මිල කැඳවීමේ ක්‍රියාවලිය අවලංගු කිරීමට කැඳවුම්කරුට ඕනෑම අවස්ථාවක අයිතිය ඇත්තේය. |
| **(ඊ)කොන්ත්‍රාත්තුව පැවරීම.** | | | |
| 14. | මිල යෝජනාවක් පිළිගැනීම | 14.1 | ලංසුකරුවකු විසින් ඉදිරිපත් කර ඇති, නිකුත් කර ඇති ලේඛන අනුව සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති, මිල ගණන් අතුරින් කැඳවුම්කරු විසින් තෝරාගනු ලැබේ. |
| 15. | පිළිගත් බව දැන්වීම | 15.1 | තෝරාගනු ලැබූ මිල යෝජනාව පිළිගත් බව එහි වලංගු කාලය ඉකුත්ව යාමට පෙර සාර්ථක ලංසුකරුට කැඳවුම්කරු විසින් ලිඛිතව දන්වා යවනු ලැබේ. |

## II කොටස, දත්ත පත්‍රිකාව

| ලංසුකරුවන් සඳහා වන උපදෙස්හි වගන්තියට යොමුව | |
|---|---|
| 1.1 | මිල කැඳවුම්කරු වන්නේ: ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>ලිපිනය: "ගොවිජන මන්දිරය",අංක 80/ 5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල |
| 4.1 | **සම්පූර්ණ කාමර වෙන්කිරීම් (Partition) තොගයම** ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය. |
| 5. 1 | මිල ගණන් 2021. 04. 29 දක්වා වලංගු විය යුතු ය. |
| 7. 1 | මුද්‍රා තබන ලද මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.<br>(අ) දත්ත පත්‍රිකාවේ 8. 1හි සඳහන් කැඳවුම්කරුගේ ලිපිනයට මිල ගණන් යොමු කළ යුතු ය.<br><br>(ආ) කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය පහත පරිදි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිළිව සඳහන් කළ යුතු ය;<br><br>"රාජගිරිය DPJ ගොඩනැගිල්ලෙහි ඇති භාවිතයෙන් පසු ඉවත් කරන කාමර වෙන් කිරීම් කොටස් (partition) ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම"<br><br>MOA/ Shopping/ 01/ 2021 |
| 8.1 | මිල යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය:<br><br>ලේකම්<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>"ගොවිජන මන්දිරය",<br>අංක 80/ 5, රජමල්වත්ත පටුමග,<br>බත්තරමුල්ල<br><br>ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය හා වේලාව: 2021. 02. 25 ප. ව 2. 00 |
| 10. 1 | පහත දැක්වෙන ස්ථානයේ දී ලංසු විවෘත කෙරේ.<br><br>ප්‍රසම්පාදන අංශය, පළමු මහල,<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>"ගොවිජන මන්දිරය",<br>අංක 80/ 5, රජමල්වත්ත පටුමග<br>බත්තරමුල්ල<br><br>ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව: 2021. 02. 25 ප. ව 2. 00 |
| 11. 1 | ඇමතුම් තොරතුරු<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රසම්පාදන) – 0112887406 |

**IIIවන කොටස**

# BOQ FOR THE REMOVING ALUMINIUM PARTITION, TIMBER FLOOR & WALL AT DPJ BUILDING OF THE MINISTRY OF AGRICULTURE.

| ITEM | DESCRIPTION | UNIT | QTY | RATE | AMOUNT |
|---|---|---|---|---|---|
| | *The bidders are strongly requested to visit the site.* | Note | | | |
| | *Existing partition material available at 10 Nos. floors including Ground floor.* | Note | | | |
| | | | | | |
| 1 | Carefully removing existing aluminium extrusion glass board partition, gypsum board partition & stacking at site including making good to walls & floors as directed (Location, DPJ building ). Client intended to re use removed materials, Hence bidder's responsible is to make minimum damaged partition materials. (max. height 9' - 0" ) | Sq.ft. | 23,760.00 | | |
| 2 | Carefully removing existing veneer board pasted on MDF board ( both side ) including aluminium "C" channel frame partition & stacking at site including making good to walls as directed (Location, DPJ building ). Client intended to re use removed materials, Hence bidder's responsible is not to make minimum damaged partition materials. (max. height 9' - 0" ) | Sq.ft. | 4,725.00 | | |
| 3 | Carefully removing existing timber plank including timber frame structure( floor & wall ) & making good to walls as directed (Location, DPJ building ). Client intended to re use removed materials, Hence bidder's responsible is not to make minimum damaged partition materials. (max. height 9' - 0" ) | Sq.ft. | 2,290.00 | | |
| 4 | Transport all the removed partition materials to Govijana Mandiraya and stacking as per directed. ( DPJ building at Rajagiriya to "Govijana Mandiraya" Battaramulla ). Rate shall including loading & unloading labour charges. | Item | 1.00 | | |
| 5 | Transporting debris cleared away from site by tractor (app 20 miles away). Rate to include dumping, loading & unloading charges. | Lord | 10.00 | | |
| | Sub Total | | | | |
| | Total Amount without VAT | | | | |
| | Add VAT 08% | | | | |
| | Total Amount with VAT | | | | |

Total Bid Sum (Exclusive of VAT) in words Rupees …………………………………………………

…………………………………………………………………………………………….... Only.

VAT Registration No. ……………………………

Date:……………………………

## IVවන කොටස

## මිල සාරාංශය ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය

**කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් රාජගිරිය DPJ ගොඩනැගිල්ලෙහි ඇති භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන කාමර වෙන් කිරීම් (partition) කොටස් ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා මිල ගණන් කැඳවීම.**

01. ආයතනයේ නම: ......................................................................................
......................................................................................

02. ආයතනයේ ලිපිනය: ......................................................................................
......................................................................................

03. දුරකථන අංකය සහ ෆැක්ස් අංකය : ............................................................

04. ආයතනයේ ලියාපදිංචි අංකය:......................................

05. මිල ගණන්

| **භාණ්ඩ තොගය** | **ඉදිරිපත් කරන මිල** | | **රු. 50, 000. 00ක ලංසු සුරක්ෂණය ගෙවන ලද කුවිතාන්සියේ අංකය** |
|---|---|---|---|
| | **ඉලක්කමින්** | **අකුරින්** | |
| කාමර වෙන්කිරීම් සහ අනෙකුත් ද්‍රව්‍ය ගලවා ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම | | | |

(අ) මාගේ මිල යෝජනාව අයි.ටී.වී. උප වගන්තියේ 8. 1හි ස්ථාවරව දක්වා ඇති මිල යෝජනා එවිය යුතු අවසාන දිනයේ සිට අයි. ටී. වී. උප වගන්තියේ 5. 1හි දක්වා ඇති කාලපරිච්ඡේදය දක්වා වලංගු වන අතර, ඊට මා බැඳී සිටිනු ඇත. එම කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක ලංසුව පිළිගනු ඇත.

(ආ) මෙම මිල යෝජනාව සමඟ වන ඔබගේ කොන්ත්‍රාත්තු ප්‍රදානය පිළිබඳ දැනුම්දීම ඇතුළත් ඔබගේ ලිඛිත පිළිගැනීම අනුව දින 03ක් ඇතුළත මා සමඟ ගිවිසුම්ගතවන බව මම දනිමි.

(ඇ) එසේ ගිවිසුම්ගත වී දින 10ක් ඇතුළත අදාළ කාමර වෙන් කිරීම් කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය සියල්ලම ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත් කර නැවත ගොවිජන මන්දිරය වෙත සුපරීක්ෂාකාරීව රැගෙන ඒමට මා බැඳී සිටින බව මම දනිමි.

(ඈ) මාගේ හෝ මාගේ යටත් සේවකයින්ගේ නොසැලකිළිමත්කම මත ගලවනු ලබනකාමර වෙන්කිරීම් සහ අනෙකුත් ද්‍රව්‍යවලට හෝ ගොඩනැඟිල්ලේ දේපලවලට හෝ සිදුවන හානිය මා වෙතින් අයකර ගැනීම සම්බන්ධයෙන් මාගේ විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කර සිටිමි.

(ඇ) සාරානුකූලව ඇගයීමට ලක් කරන ලද, මිල යෝජනාව හෝ වෙනත් කිසියම් මිල යෝජනාවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව මම දනිමි.

................................ ..................................

දිනය **අත්සන**

**(ආයතනයේ නිල මුද්‍රාව)**

## V වන කොටස

## කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සහ උපදෙස්

- DPJ ගොඩනැඟිල්ලේ ඇති ගලවා රැගෙන ඒමට නියමිත **සියලුම කාමර වෙන්කිරීම් කොටස් ද සුන්බුන් ද එම ගොඩනැඟිලි පරිශ්‍රයෙන් ඉවත්කොට ගොවිජන මන්දිරය වෙත රැගෙන ආ යුතු ය.**
- භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන කාමර වෙන් කිරීම් (partition) කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය, ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒම සඳහා ස්ථානීය පරීක්ෂාවකින් පසු මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය.
- මෙලෙස ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒමට නියමිත කාමර වෙන් කිරීම් (partition) කොටස් සහ අනෙකුත් ද්‍රව්‍ය **2021. 02. 23** දින **ප. ව 2. 30**ට අංක 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය ලිපිනයෙහි පිහිටි DPJ ගොඩනැඟිල්ලේ දී පරීක්ෂා කිරීමට හැකි ය.
- **ආපසු ගෙවනු ලබන රු. 50, 000. 00ක්** වටිනා ලංසු සුරක්ෂණය **2021. 02. 22 දින සිට 2021. 02. 24** දින දක්වා **පෙ. ව. 9. 00 සිට ප. ව. 2. 30** දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පළමු මහලේ පිහිටි සරප් අංශය වෙත ගෙවිය හැකි ය.
- එසේ ගෙවා ලබා ගත් කුවිතාන්සියේ පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. කුවිතාන්සියේ මුල් පිටපත ලංසුකරු සන්තකයේ තබා ගත යුතු ය.
- ජයග්‍රාහී ලංසුකරු හෝ ලංසුකරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය ලිඛිතව දැනුම් දෙනු ලබන අතර එම ලිපියෙහි සඳහන් දින සිට **දින 03ක්** ඇතුළත **ගිවිසුම්ගතවීමට** කටයුතු කළ යුතු වේ.
- ජයග්‍රාහී ලංසුකරු හෝ ලංසුකරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය ලිඛිතව දැනුම් දී **දින 10ක්** ඇතුළත අදාළ කාමර වෙන් කිරීම් (partition) කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය ගලවා නැවත ගොවිජන මන්දිරය වෙත රැගෙන ඒමට කටයුතු කළ යුතු ය.
- මෙම කාමර වෙන් කිරීම් (partition) කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය ගැලවීමේ දී එම කාර්යය ඉතා සුපරීක්ෂාකාරීව සිදුකළ යුතු ය.
- මෙම කාර්යය අතරතුර ගලවා රැගෙන ඒමට නියමිත කාමර වෙන් කිරීම් (partition) කොටස් හා අනෙකුත් ද්‍රව්‍යවලට හෝ DPJ ගොඩනැඟිල්ලේ දේපළවලට, ලංසුකරු හෝ ඔහුගේ සේවකයින්ගේ නොසැලකිලිමත්කම මත මොනයම් හෝ ආකාරයක හානියක් සිදුවුවහොත් අදාළ **ලංසුකරුගේ ලංසු සුරක්ෂණය රාජසන්තක කිරීමට** කටයුතු කරනු ලැබේ.
- කාමර වෙන් කිරීම් (partition) කොටස් හා අනෙකුත් ද්‍රව්‍ය ඉවත් කිරීමේ දී සහ ගැලවීමේ දී ලංසුකරු හෝ ඔහුගේ සේවකයින් හට හෝ සිදුවන අලාභහානි පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.
- මෙම ලංසුව සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සතු වේ.